# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1636/17 - 2010 ජනවාරි 15 වැනි සිකුරාදා - 2010.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාත් සභාව

2009 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් සම්මත කොට 2009 දෙසැම්බර් මස 16 වැනි දින උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සහතික කරන ලද පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළකරමි.

ජී. ඩී. කීර්ති ගමගේ,<br>ලේකම්,<br>උතුරු මැද පළාතේ පළාත් සභාව.

2009 දෙසැම්බර් මස 21 වැනි දින,<br>උතුරු මැද පළාතේ පළාත් සභවේ දී ය.

**2009 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය**

2010 මුදල් වර්ෂයේ වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, ඒ මුදල් වර්ෂය තුළ උතුරු මැද පළාතේ පළාත් සභාවේ, කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් එම මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළහැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, පළාත් අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම හා යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා ය.

***2009 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය***

(සහතිකය සටහන් කළේ 2009.12.16 වැනි දිනය)

2010 මුදල් වර්ෂයේ වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, ඒ මුදල් වර්ෂය තුළ උතුරු මැද පළාතේ පළාත් සභාවේ කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් එම මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළහැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, පළාත් අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම හා යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ ප්‍රඥප්තියකි.

1. ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ. මේ ප්‍රඥප්තිය 2009 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

1A - PG 001110 —430 (2010/01)

2010 මුදල් වර්ෂය සඳහා විසර්ජනය,

2. (i) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැති ව මේ ප්‍රඥප්තියෙහි 2010 මුදල් වර්ෂය යනුවෙන් සඳහන් කරනු ලබන, 2010 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ ව 2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රුපියල් එක් දහස් දෙසිය හතලිස් තුන් කෝටි හැත්තෑ අට ලක්ෂ පනස් නවදාහක් වූ පළාත් සභාවේ වියදම පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළහැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ යෙදීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් පියවිය යුතු ය. මෙහි ඉහත සඳහන් කළ රුපියල් එක් දහස් දෙසිය හතලිස් තුන් කෝටි හැත්තෑ අට ලක්ෂ පනස් නවදාහක් වූ මුදල මේ ප්‍රඥප්තියේ පළමුවැනි උපලේඛනයේ නියමිත පරිදි වැයකළ හැකි ය.

(ii) මේ වගන්තියේ (i) වැනි උපවගන්තියේ විධිවිධාන පළාත් සභාව සඳහා හා පළාත් සභාව වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියකට, විධිවිධානවලට හානියක් නොමැති ව බලපැවැත්විය යුතු ය.

වැඩසටහනක පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන ලද නමුත් වියදම් නොකරන ලද වියදමේ මුදල් ඒ වැඩසටහනේම වෙනත් මුදල් වෙන් කිරීමකට හෝ ඒ වැය ශීර්ෂය යටතේ ම වූ වෙනත් වැඩ සටහනක ට හෝ මාරු කිරීමේ බලය.

3. (i) මේ ප්‍රඥප්තියේ පළමුවැනි උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර වෙන් කරනු ලැබුවා වූ ද, එසේ වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙණු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද, යම් මුදලක් එම වැඩසටහනේ ම මූලධන වියදම් වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේ ම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ ප්‍රධාන ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධාරියකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(ii) මේ ප්‍රඥප්තියේ පළමුවැනි උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ මූලධන වියදමකට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

2010 මුදල් වර්ෂය සඳහා ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදනය

4. මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ සඳහන් උතුරු මැද පළාතේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ඇස්තමේන්තු කර ඇති උපරිම වියදම් සීමාව වන රුපියල් තිස් හතර කෝටි අසූ හය ලක්ෂය උතුරු මැද පළතේ පළාත් සභා අරමුදලින් දැරීමටත්, අත්තිකාරම් ගිණුම් කටයුතු වෙනුවෙන් ලැබේ යැයි ඇස්තමේන්තු කර ඇති රුපියල් තිස් දෙකෝටි හැට හත් ලක්ෂ විසි දෙදාහ උතුරු මැද පළාත් සභා අරමුදලට ලබා ගැනීමටත් මෙයින් බලය දෙනු ලැබේ.

(i) මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ (iii) වැනි තීරයෙහි දැක්වෙන එක් එක් ගිණුම් කාර්යයෙන් පළාත් සභාව ලබන ලැබීම් ඒ කටයුත්තේ ගිණුමට බැර කළයුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල එකතුව එම උපලේඛනයේ (v) වැනි තීරයේ අනුරූපි සටහනෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 2010 මුදල් වර්ෂය අවසන් වී තුන් මාසයක් ඉකුත් වීමට පෙර පළාත් සභා අරමුදලට ගෙවිය යුතු ය.

(ii) (i) වැනි උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිශ්චය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ගෙවීම්, එනම් —

(අ) යම් කටයුත්තක ආදායම අයකිරීම සඳහා නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත හෝ එම කටයුත්තේ කාර්ය සාධන සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) යම් කටයුත්තක චංචල හා නිශ්චල දේපළ ක්ෂය වීම ආවරණය සඳහා ප්‍රතිපාදන ඒ එක් එක් කටයුත්තේ ආදායමින්,

අඩුකළ යුතු ය.

(iii) මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ (iii) වැනි තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන් 2010 මුදල් වර්ෂය තුළ පළාත් සභාව විසින් දරනු ලබන වියදම් ඒ මුදල් වර්ෂය තුළ දී ඒ කටයුත්තෙන් පළාත් සභාව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් ඒ වියදම් ඒ උපලේඛනයේ (iv) වැනි තීරයෙහි අනුරූපී සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය ඒ උපලේඛනයේ (vi) වැනි තීරයෙහි අනුරූපී සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

—

(iv) මෙම වගන්තියේ සඳහන් අත්තිකාරම් ගිණුම්වල උපරිම වියදම් සීමාව (හර) සහ අවම ලැබීම් සීමාව (බැර) තීරණය කිරීමේදී මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ සඳහන් අත්තිකාරම් ගිණුම් අතර මුදල් හුවමාරුවකින් තොරව ණය ශේෂ පියවීම සඳහා කරනු ලබන හර සහ බැර සැලකිල්ලට නොගත යුතු ය.

2010 මුදල් වර්ෂය තුළ දී 4 වැනි වගන්තියේ සඳහන් කටයුතු පිළිබඳ වියදම් සඳහා පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුසුස්සක් කළ හැකි හෝ වෙනත් යම් අරමුදලකින් නැතහොත් මුදල් වලින් අත්තිකාරම් ගෙවීම.

5. 2010 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ (iii) වැනි තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් පළාත් සභාව ලබන ලැබීම් ඒ කටයුත්ත සම්බන්ධයෙන් පළාත් සභාව විසින් දරනු ලබන වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, ඒ වියදම පියවීම සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා සලකන මුදල්, පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යැයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකි ය. එසේ වුව ද එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල එකතුව ඒ උපලේඛනයේ (iv) වැනි තීරයේ අනුරූපී සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. ඒ කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට පළාත් සභා අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

කලින් බලය දෙනු ලැබූ වියදම් සීමා කිරීමට අමාත්‍යවරයා සතු බලය

6. (i) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම් බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩුවිය හැකි බවට ; හෝ

(ii) යම් විශේෂ කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට, අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදා හරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ඉවත් කර ගැනීමට අමාත්‍යවරයා විසින් පළාත් සභාවේ අනුමැතිය ඇතිව කරනු ලැබිය හැකි ය.

මේ ප්‍රඥප්තියෙහි දෙවැනි උපලේඛනයේ දැක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට අමාත්‍යවරයා සතු බලය

7. (i) මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ (iv) තීරයෙහි සහ (vi) වැනි තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක් ;

(ii) මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ (V) වැනි තීරයෙහි දැක්වෙන අවම සීමා—

අමාත්‍යවරයා විසින් පළාත් සභාවේ අනුමැතිය ඇතිව නියමයක් මගින් 2011 පෙබරවාරි මස 28 වැනි දින හෝ එදිනට පෙර වෙනස් කිරීම් හෝ අමුතු කිරීම් හෝ කරනු ලැබිය හැකි ය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක් යෝජනා සම්මතයක් මගින් පළාත් සභාව විසින් අනුමත කර ඇත්නම් මිස බල නොපැවැත්විය යුතු ය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යැයි එහි ප්‍රකාශිතව ම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිත ව සඳහන් වන දින සිට එය බලාත්මක වන ලෙස සැලකිය යුතු ය.

මේ ප්‍රඥප්තියේ 2 වැනි උපලේඛනය සංශෝධනය කිරීමට පළාත් සභාව සතු බලය

8. පළාත් සභාව විසින් යෝජනා සම්මතයක් මගින් මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් ; සහ —

(i) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්,

(ii) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන්

ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.

අමාත්‍යවරයා යන්න අර්ථ දැක්වීම

9. මෙහි අමාත්‍යවරයා යන්න එම අවස්ථාවේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන අමාත්‍යවරයා අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

10. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*පළමුවැනි උපලේඛනය*

පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු වියදම්

| *ශීර්ෂ අංකය* | *ආයතනය* | *පුනරාවර්තන වියදම් රු.* | *මූලධන වියදම් රු.* |
|---|---|---|---|
| 600 | ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය<br>වැඩ සටහන 03- පළාත් සභා පරිපාලනය | 2,39,18,000 | 80,00,000 |
| 601 | පළාත් සභාව සහා ලේකම් කාර්යාලය<br>වැඩ සටහන 03-පළාත් සභා පරිපාලනය | 6,77,22,000 | 10,00,000 |
| 602 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>වැඩ සටහන 03-පළාත් සභා පරිපාලනය | 89,14,000 | 5,00,000 |
| 603 | සමුපකාර සේවක කොමිෂන් සභාව<br>වැඩ සටහන 03-පළාත් සභා පරිපාලනය | 38,28,000 | 5,00,000 |
| 609 | ප්‍රධාන ලේකම් කාර්යාලය<br>වැඩ සටහන 03-පළාත් සභා පරිපාලනය, | 6,05,28,000 | 11,27,00,000 |
| | වැඩ සටහන 9-මානව සම්පත් සංවර්ධනය | 1,08,42,000 | 13,75,93,000 |
| 610 | පළාත් භාණ්ඩාගාරය<br>වැඩ සටහන 08 - මුල්‍ය කළමනාකරණය | 17,01,34,000 | 2,06,50,000 |
| 611 | පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 03-පළාත් සභා පරිපාලනය | 1,63,44,000 | 2,80,00,000 |
| 612 | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 52-යටිතල පහසුකම් සංවර්ධනය | 6,07,74,000 | 30,00,000 |
| 626 | අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 8 - මුල්‍ය කළමණාකරණය | 92,45,000 | 5,00,000 |
| 627 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 03-පළාත් සභා පරිපාලනය | 2,78,54,000 | 57,00,000 |
| | ***ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ආර්ථික ප්‍රවර්ධන, පළාත් ඉංජිනේරු, ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ, ප්‍රවෘත්ති, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පරිසර, ප්‍රවාහන, සංස්කෘතික, සංචාරක සහ බලශක්ති කටයුතු අමාත්‍යාංශය :*** | | |
| 604 | ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ආර්ථික ප්‍රවර්ධන, පළාත් ඉංජිනේරු, ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ, ප්‍රවෘත්ති, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පරිසර, ප්‍රවාහන, සංස්කෘතික, සංචාරක සහ බලශක්ති කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන 03-පළාත් සභා පරිපාලනය | 12,22,74,000 | 44,01,00,000 |
| | වැඩ සටහන 91 - සංස්කෘතික සංවර්ධනය | 39,44,000 | |

පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු වියදම් (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය | ආයතනය | පුනරාවර්තන වියදම් රු. | මූලධන වියදම් රු. |
|---|---|---|---|
| 613 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 03-පළාත් සභා පරිපාලනය | 14,72,62,000 | 1,24,50,000 |
| | සටහන 80 - ප්‍රාථමික අධ්‍යාපනය | 1,48,70,26,000 | 5,63,55,000 |
| | වැඩ සටහන 81 - ද්විතීයික අධ්‍යාපනය | 3,00,71,64,000 | 24,74,80,000 |
| | වැඩ සටහන 87 - අධ්‍යාපන ප්‍රවේශය හා සහභාගීත්වය දියුණු කිරීම | 1,33,48,000 | 1,27,15,000 |
| | වැඩ සටහන 88 - අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා | 8,65,44,000 | 2,40,00,000 |
| 615 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 03- පළාත් සභා පරිපාලනය | 31,53,66,000 | 13,62,46,000 |
| 619 | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 40 - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 3,17,40,000 | 1,00,00,000 |
| 625 | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 43- වාරිමාර්ග | 6,38,01,000 | 20,00,00,000 |
| | ***කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන, හා සත්ව සෞඛ්‍ය, වනිතා කටයුතු සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය :*** | | |
| **605** | කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන, හා සත්ව සෞඛ්‍ය, වනිතා කටයුතු සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන 3 - පළාත් සභා පරිපාලනය | 2,81,16,000 | 4,50,00,000 |
| 617 | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 44 - කෘෂි කාර්මික සංවර්ධනය | 8,67,12,000 | 4,70,00,000 |
| 618 | පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 45 - පශු සම්පත් සංවර්ධනය | 8,64,87,000 | 3,70,00,000 |
| | ***සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය :*** | | |
| **606** | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 2,77,32,000 | 2,00,00,000 |
| 614 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 70 - පොදු සෞඛ්‍ය සේවාවන් | 16,99,63,000 | 3,94,10,000 |
| | වැඩ සටහන 71 - රෝහල් සේවාවන් | 1,57,03,83,000 | 20,70,50,000 |
| | වැඩ සටහන 72 - මහජන සෞඛ්‍ය සේවාවන් | 34,92,81,000 | 9,60,99,000 |
| | වැඩසටහන 74 - පර්යේෂණ හා සංවර්ධන | 55,95,000 | |
| 622 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 73 - දේශීය වෛද්‍ය සේවාවන් | 14,12,91,000 | 7,00,00,000 |

පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු වියදම් (සම්බන්ධිතයි)

| ශීර්ෂ අංකය | ආයතනය | පුනරාවර්තන වියදම රු. | මූලධන වියදම රු. |
|---|---|---|---|
| 623 | පළාත් පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 95 - සමාජ ආරක්ෂණය | 3,59,54,000 | 1,60,00,000 |
| 624 | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 95-සමාජ ආරක්ෂණය | 13,21,40,000 | 1,60,00,000 |
| 629 | පළාත් ක්‍රීඩා කටයුතු දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 90 - ක්‍රීඩා | 1,92,74,000 | 1,70,00,000 |
| | ***සමුපකාර, වෙළඳ හා ආහාර, පේෂකර්මාන්ත, ග්‍රාම සංවර්ධන, කර්මාන්ත සහ නිවාස කටයුතු අමාත්‍යාංශය :*** | | |
| 607 | සමුපකාර, වෙළඳ හා ආහාර, පේෂකර්මාන්ත, ග්‍රාම සංවර්ධන, කර්මාන්ත සහ නිවාස කටයුතු අමාත්‍යාංශය<br>වැඩ සටහන 3 -පළාත් සභා පරිපාලනය | 2,83,11,000 | 2,10,00,000 |
| 616 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 53 - සමුපකාර සංවර්ධන | 3,88,78,000 | 60,00,000 |
| 620 | පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 51 - කර්මාන්ත සංවර්ධන | 5,34,64,000 | 3,00,00,000 |
| 621 | පළාත් ග්‍රාම සංවර්ධන කටයුතු දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන 60- ප්‍රජා සංවර්ධනය | 2,08,24,000 | 2,20,00,000 |
| | ***ග්‍රාමීය යටිතල පහසුකම්, පළාත් මාර්ග සංවර්ධන, විදුලිබල හා ධීවර කටයුතු අමාත්‍යාංශය :*** | | |
| 608 | ග්‍රාමීය යටිතල පහසුකම්, පළාත් මාර්ග සංවර්ධන, විදුලිබල හා ධීවර කටයුතු අමාත්‍යාංශය<br>වැඩ සටහන 3 - පළාත් සභා පරිපාලනය | 10,68,34,000 | 1,65,10,00,000 |
| | **එකතුව** | **8,63,98,11,000** | **3,79,80,48,000** |

**උතුරු මැද පළාත් සභාව**

***දෙවැනි උපලේඛනය***

අයවැය ඇස්තමේන්තු 2010 අත්තිකාරම් ගිණුම් කටයුතු

| I<br>කාර්යාලය | II<br>ගිණුම් අංකය | III<br>ගිණුම් කාර්යය | IV<br>හර<br>රු. | V<br>බැර<br>රු. | VI<br>අවසාන ශේෂය<br>රු. |
|---|---|---|---|---|---|
| ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | 60001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 10,00,000 | 6,30,000 | 27,54,864 |
| පළාත් සභා ලේකම් කාර්යාලය | 60101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 20,00,000 | 4,00,000 | 32,25,869 |
| | 60111 | පළාත් සභා මන්ත්‍රීවරුන්ට ණය අත්තිකාරම් | | 40,00,000 | 66,07,399 |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 60201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 12,00,000 | 11,00,000 | 15,08,581 |
| පළාත් සමුපකාර සේවා කොමිෂන් සභාව | 60301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 4,00,000 | 1,15,000 | 6,25,000 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 60901 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 35,00,000 | 1,50,00,000 | 10,53,38,227 |
| ප්‍රාදේශීය පාලනය | 60911 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 16,00,000 | 15,00,000 | 32,87,537 |
| පළාත් භාණ්ඩාගාරය | 61001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 25,00,000 | 5,00,000 | 41,50,000 |

අත්තිකාරම් ගිණුම් කටයුතු (සම්බන්ධිතයි)

| I<br>කාර්යාලය | II<br>ගිණුම් අංකය | III<br>ගිණුම් කාර්යය | IV<br>හර<br>රු. | V<br>බැර<br>රු. | VI<br>අවසාන ශේෂය<br>රු. |
|---|---|---|---|---|---|
| පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 61101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 28,00,000 | 5,00,000 | 47,00,000 |
| පළාත් ඉංජිනේරු | 61201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 60,00,000 | 68,00,000 | 3,12,03,387 |
| පළාත් අභ්‍යන්තර විගණන | 62601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 7,00,000 | 5,60,000 | 42,48,717 |
| පළාත් ආදායම් | 62701 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 30,00,000 | 18,00,000 | 1,03,53,673 |
| **ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ආර්ථික ප්‍රවර්ධන, පළාත් ඉංජිනේරු, ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ, ප්‍රවෘත්ති, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පරිසර, ප්‍රවාහන, සංස්කෘතික, සංචාරක සහ බලශක්ති කටයුතු අමාත්‍යාංශය :** | | | | | |
| ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ආර්ථික ප්‍රවර්ධන, පළාත් ඉංජිනේරු, ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ, ප්‍රවෘත්ති, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පරිසර, ප්‍රවාහන, සංස්කෘතික, සංචාරක සහ බලශක්ති කටයුතු අමාත්‍යාංශය | 60401 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 50,00,000 | 42,00,000 | 1,15,94,363 |
| | 604011 | ස්වයං රැකියා චක්‍රීය ණය අත්තිකාරම් ගිණුම | 30,00,000 | 10,00,000 | 20,00,000 |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 61301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 12,50,00,000 | 12,80,00,000 | 28,10,12,239 |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | 61501 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 1,10,00,000 | 93,63,000 | 2,08,53,894 |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 61901 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 40,00,000 | 24,65,000 | 1,21,36,714 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 62501 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 10,00,000 | 4,86,000 | 30,97,632 |
| **උප එකතුව** | | | **17,37,00,000** | **17,84,19,000** | **50,86,98,096** |

| I<br>කාර්යාලය | II<br>ගිණුම් අංකය | III<br>ගිණුම් කාර්යය | IV<br>හර<br>රු. | V<br>බැර<br>රු. | VI<br>අවසාන ශේෂය<br>රු. |
|---|---|---|---|---|---|
| **කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, වනිතා කටයුතු සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය :** | | | | | |
| කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, වනිතා කටයුතු සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය | 60501 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 30,00,000 | 11,75,000 | 68,71,851 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 61701 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 70,00,000 | 64,90,000 | 2,92,34,820 |
| | 61702 | කෘෂි සංවර්ධන අත්තිකාරම් | 50,00,000 | 45,00,000 | 10,08,000 |
| සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 61801 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 70,00,000 | 41,07,000 | 2,02,76,728 |
| | 61802 | සත්ව සංවර්ධන අත්තිකාරම් | 17,00,000 | 16,00,000 | 1,75,684 |
| **සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය :** | | | | | |
| සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 60601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 30,00,000 | 4,93,000 | 47,72,000 |

**අත්තිකාරම් ගිණුම් කටයුතු (සම්බන්ධිතයි)**

| I කාර්යාලය | II ගිණුම් අංකය | III ගිණුම් කාර්යය | IV හර රු. | V බැර රු. | VI අවසාන ශේෂය රු. |
|---|---|---|---|---|---|
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 61401 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 5,50,00,000 | 4,73,00,000 | 15,65,37,776 |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 62201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 90,00,000 | 51,49,000 | 2,54,47,676 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 62301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 40,00,000 | 16,93,000 | 99,74,272 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 62401 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 40,00,000 | 25,18,000 | 1,35,25,472 |
| ක්‍රීඩා කටයුතු දෙපාර්තමේන්තුව | 62901 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 28,00,000 | 12,75,000 | 90,47,478 |
| **සමුපකාර, වෙළඳ හා ආහාර, පේෂ කර්මාන්ත, ග්‍රාම සංවර්ධන, කර්මාන්ත සහ නිවාස කටයුතු අමාත්‍යාංශය :** | | | | | |
| සමුපකාර, වෙළඳ හා ආහාර, පේෂ කර්මාන්ත, ග්‍රාම සංවර්ධන, කර්මාන්ත සහ නිවාස කටයුතු අමාත්‍යාංශය | 60701 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 30,00,000 | 13,90,000 | 73,11,269 |
| සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 61601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 50,00,000 | 35,18,000 | 1,77,66,864 |
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 62001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 60,00,000 | 21,98,000 | 1,40,41,693 |
| | 62002 | පේෂ කර්මාන්ත කටයුතු අත්තිකාරම් | 1,41,00,000 | 1,50,00,000 | 1,09,14,271 |
| | 62003 | වඩු පාසල් කටයුතු අත්තිකාරම් | 1,40,00,000 | 1,50,00,000 | 1,29,59,620 |
| ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 62101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 35,00,000 | 16,16,000 | 1,03,34,623 |
| **උප එකතුව** | | | **14,71,00,000** | **11,50,22,000** | **35,02,00,097** |

**උතුරු මැද පළාතේ පළාත් සභාව**

අය වැය ඇස්තමේන්තු — 2010

**අත්තිකාරම් ගිණුම් කටයුතු**

| I කාර්යාලය | II ගිණුම් අංකය | III ගිණුම් කාර්යය | IV හර රු. | V බැර රු. | VI අවසාන ශේෂය රු. |
|---|---|---|---|---|---|
| **ග්‍රාමීය යටිතල පහසුකම්, පළාත් මාර්ග සංවර්ධන, විදුලි බල සහ ධීවර කටයුතු අමාත්‍යාංශය:** | | | | | |
| ග්‍රාමීය යටිතල පහසුකම්, පළාත් මාර්ග සංවර්ධන, විදුලි බල සහ ධීවර කටයුතු අමාත්‍යාංශය | 60801 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 28,00,000 | 16,23,000 | 93,16,659 |
| | 60802 | තාර මිලට ගැණුම් අත්තිකාරම් | 2,50,00,000 | 3,00,00,000 | 1,28,85,849 |
| **උප එකතුව** | | | **2,78,00,000** | **3,16,23,000** | **2,22,02,508** |

2010 — අත්තිකාරම් ගිණුම් කටයුතු (සම්බන්ධිතයි)

| I<br>කාර්යාලය | II<br>ගිණුම් අංකය | III<br>ගිණුම් කාර්යය | IV<br>හර<br>රු. | V<br>බැර<br>රු. | VI<br>අවසාන ශේෂය<br>රු. |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- නැ.නුප | 63001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 96,000 | 1,31,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- ම.නුප | 63011 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 36,000 | 4,56,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- තිරප්පනේ | 63021 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 27,000 | 4,10,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- නොච්චියාගම | 63031 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 24,000 | 2,80,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- මහවිලච්චිය | 63041 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 19,000 | 1,09,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- ඉපලෝගම | 63051 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 68,000 | 3,13,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- මිහින්තලේ | 63061 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 1,07,000 | 2,89,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- තලාව | 63071 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 1,42,000 | 12,97,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-හොරොව්පොතාන | 63081 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 27,000 | 7,92,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- ගලෙන්බිඳුණුවැව | 63091 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 92,000 | 1,13,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- මැදවච්චිය | 63101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 59,000 | 1,73,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- පදවිය | 63111 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 26,000 | 4,72,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- රඹෑව | 63121 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 71,000 | 4,09,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- පලාගල | 63131 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 33,000 | 4,75,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- කහටගස්දිගිලිය | 63141 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | | 3,31,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- කැකිරාව | 63151 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 57,000 | 1,29,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- පලුගස්වැව | 63161 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 62,000 | 1,81,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- තඹුත්තේගම | 63171 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 1,03,000 | 21,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- කැබිතිගොල්ලෑව | 63181 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 59,000 | 1,09,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- රාජාංගනය | 63191 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 30,000 | 1,38,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- ගල්නෑව | 63201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 59,000 | 1,65,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- නාච්චාදූව | 63211 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 41,000 | 5,60,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- හිඟුරක්ගොඩ | 63221 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 14,000 | 14,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- මැදිරිගිරිය | 63231 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 29,000 | 5,76,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- දිඹුලාගල | 63241 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 40,000 | 5,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- ඇලහැර | 63251 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 47,000 | 2,62,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- ලංකාපුර | 63261 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 28,000 | 3,18,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- තමන්කඩුව | 63271 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 2,10,000 | 3,14,000 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- වැලිකන්ද | 63281 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | | 52,000 | 77,000 |
| **උප එකතුව** | | | | **16,58,000** | **89,19,000** |
| **මුලු එකතුව** | | | **34,86,00,000** | **32,67,22,000** | **89,00,19,701** |

01-684

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

: